# විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## අධ්‍යාපන පීඨය

## පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (සති අන්ත) පරීක්ෂණය - 2019

## විෂයමාලාව සහ පාසල් සංවිධානය

**කාලය පැය තුනයි**

**කොටස් දෙකෙන් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

**කොටස් දෙකෙහි පිළිතුරු වෙන වෙනම පොත්වල ලියා වෙන වෙනම අමුණා, පිළිතුරු පත්‍ර දෙකක් ලෙස බාර දෙන්න.**

---

### I කොටස - විෂයමාලා සංවිධානය

1. i. "ඉගෙනුම් අවස්ථා සංවිධානය සඳහා සැලසුම් සහගත ව සකස් කළ වැඩ සටහනක් ලෙස විෂයමාලාව හැඳින්විය හැකිය." පිළිගත් නිර්වචන දෙකක් ඇසුරින් ඉහත සඳහන් ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. "ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවත්නා පාසල්වල පොදු විෂයමාලාවක් ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කළද. එකී පාසල්වල ක්‍රියාත්මක විෂයමාලාව පාසලින් පාසලට විවිධ වූ ස්වරූපයක් ගනී. " යෝග්‍ය නිදසුන් ගෙන හැර දක්වමින් මෙකී විවිධත්වයට තුඩු දෙන කරුණු ගෙන හැර දක්වන්න.

(ලකුණු 15)

2. i. විෂයමාලා සංවර්ධන ක්‍රියාවලියක දී අන්‍යෝන්‍ය වශයෙන් ගළපා ගත යුතු විෂයමාලා ප්‍රභේද තුනක් ලෙස විෂයමාලා න්‍යාය, විෂයමාලා සංවර්ධන ආකෘතිය හා විෂයමාලා සංවර්ධන රටාව යන සංකල්ප කෙටියෙන් හඳුන්වන්න.

(ලකුණු 10)

ii. විධිමත් පාසලේ ක්‍රියාත්මක කෙරෙන ප්‍රාථමික, කනිෂ්ඨ ද්විතියික හා ජ්‍යෙෂ්ඨ ද්විතියික විෂයමාලා අතුරින් එක් විෂයමාලාවක් සඳහා ඉහත 2(i) හි සඳහන් සම්බන්ධතාව කෙබඳු ආකාරයට ගළපා ගැනීම යෝග්‍යවේ ද' යි පැහැදිලි කරන්න. (ලකුණු 15)

3. i. මේවායින් දෙකක් පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

අ. පාසල් විෂයමාලා කෙරෙහි එල්ල වී ඇති අභියෝග

ආ. පරමාර්ථ, අරමුණු හා සුවිශේෂ අරමුණු අතර පැවතිය යුතු අන්‍යෝන්‍ය සබඳතාව

ඇ. විෂයමාලාවේ තිරස් හා සිරස් සමෝධානය

ඉ. විෂය කරුණු තේරීමේ ප්‍රවේශ

(ලකුණු 10)

ii. පහත සඳහන් ඒවායින් එක් මාතෘකාවක් යටතේ, පාසල් ගුරුවරුන් යාවත්කාලීන කිරීමට යෝග්‍ය ලිපියක් සකස් කරන්න.

අ. පාසල තුළ ක්‍රියාත්මක සැඟවුන විෂයමාලාවෙහි ස්වභාවය

ආ. පාසල් ඉගෙනුම් අත්දැකීම් සංවිධානය

ඇ. 2015 හඳුන්වා දුන් ඉගෙනුම් ඵල පාදක විෂයමාලාව

(ලකුණු 15)

4. i. විෂයමාලා සංවර්ධනයේ දී භාවිත කෙරෙන අරමුණු ආකෘති <u>තුනක් නම් කර</u>, ඉන් එකක් ආශ්‍රිතව විෂයමාලා සංවර්ධනය වන ආකාරය විස්තර කරන්න.

(ලකුණු 10)

ii. ලෝටන්ගේ විෂයමාලා සංවර්ධන ආකෘතියේ මූලික අවස්ථා රූපසටහනක් ඇසුරින් දක්වා, එම ආකෘතිය අරමුණු ආකෘතිවලට වඩා වෙනස් වන්නේ කෙසේදැ යි විස්තර කරන්න.

(ලකුණු 15)

5. i. කිසියම් විෂය ක්ෂේත්‍රයකට යෝග්‍ය විෂය කරුණු තේරීමේ දී විෂයමාලා සම්පාදකයින් මුහුණපාන දුෂ්කරතා <u>පහක්</u> කෙටියෙන් හඳුන්වන්න.

(ලකුණු 10)

ii. පාසල් විෂයමාලාව සඳහා තෝරා ගත් එක් විෂයක අන්තර්ගතය තෝරා ගැනීමේ දී උපයෝගී කර ගන්නා නිර්ණායක (මූලධර්ම) <u>පහක්</u> නම් කර, පාසල් විෂයමාලාවේ ඔබ තෝරා ගත් එක් විෂයක අන්තර්ගතය තුළ එකී නිර්ණායක කොතෙක් දුරට උපයෝගී කරගෙන ඇත්දැයි විමර්ශනය කරන්න.

(ලකුණු 15)

## <u>II කොටස - පාසල් සංවිධානය</u>

1. i. ගුරු වගවීමට අයත් නිර්ණායක නම් කරන්න. (ලකුණු 5)

ii. ගුරුවගවීම නිසි ලෙස ඉටුකිරීමට හොයිල් (Hoyle) ඉදිරිපත් කළ ගුරු භූමිකා වැදගත්වන ආකාරය පෙන්වා දෙන්න.

(ලකුණු 10)

iii. ඵලදායී ගුරුවරයෙකු වීම සඳහා ගුරුවරයා සතුවිය යුතු අත්‍යාවශ්‍ය කුසලතා දහක් (10) නම් කරන්න.

(ලකුණු 10)

2. i. පන්තිකාමර කළමනාකරණය යනු කුමක්දැයි පිළිගත් නිර්වචන දෙකක් ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

ii. ඵලදායී පන්තිකාමර ඉගැන්වීමක් සඳහා ගුරුවරයෙකුට පන්තිකාමර කළමනාකරණය වැදගත්වන ආකාරය උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

3. i. අධීක්ෂණය පිළිබඳ නිර්වචනයක් ඇසුරින් අධීක්ෂණයෙහි වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 5)

ii. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි ඵලදායීතාව සඳහා යොදාගත හැකි අධීක්ෂණ ක්‍රම ශිල්ප දෙකක් විස්තර කරන්න. (ලකුණු 10)

iii. සාම්ප්‍රදායික හා නූතන අධීක්ෂණ ලක්ෂණවල ඇති වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 10)

4. i. ව්‍යාපෘතියක් යනු කුමක්දැයි නිර්වචනය කරන්න. (ලකුණු 5)

ii. පාසල් ව්‍යාපෘති සංවිධානයේ දී ව්‍යාපෘති චක්‍රයේ විවිධ අදියර වැදගත් වන ආකාරය උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 20)

5. i. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් සඳහා කෙටි සටහන් ලියන්න.

අ. පාසල් පාදක කළමනාකරණය

ආ. පාසල ඉතා විධිමත් සංවිධානයකි

ඉ. ගුරුවෘත්තිකභාවය සංවර්ධනය කිරීම සඳහා ගුරුවරයා පාදකව හා පාසල පාදකව ගතහැකි ක්‍රියාමාර්ග

ඊ. අධ්‍යාපන සැලසුම්කරණය හා කළමනාකරණය

(ලකුණු 12 ½ ×2 = 25)

OoOoOoOoOoOoOoOo